Australian Government
Department of Education and Training

# සංක්‍රමණික වැඩිහිටියන් සඳහා ඉංග්‍රීසි වැඩසටහන(Adult Migrant English Program) මගින් ඉංග්‍රීසි ඉගෙනීම

## Adult Migrant English Program

ඉංග්‍රීසි ඕස්ට්‍රේලියාවේ ජාතික භාෂාවයි. ඕස්ට්‍රේලියාවේ ජනතාව භාෂා ගණනාවක් කතා කළද, ඉංග්‍රීසි කතා කිරීම සහ තේරුම් ගැනීම ඔබට සම්පූර්ණයෙන්ම ඕස්ට්‍රේලියාවේ ජීවිතයට සහභාගී වීමට උපකාරී වනු ඇත. ඉංග්‍රීසි නොමැති නම් ඔබට ඕස්ට්‍රේලියාවේ පුරවැසිභාවය හා වැදගත් සේවා ලබා ගැනීමටත් ස්වාධීනව ජීවත් වීමටත් අපහසු වනු ඇත.

ඉංග්‍රීසි ඉගෙන ගැනීමට උදව් ලබා ගැනීමට ඔබට Adult Migrant English Program (AMEP)සඳහා සහභාගී විය හැක.

## AMEP යනු කුමක්ද?

AMEP සඳහා අරමුදල් සපයන්නේ ඕස්ට්‍රේලියානු රජය (Australian Government) වන අතර එයින් සුදුසුකම් ඇති සංක්‍රමණිකයන්ට සහ මානුෂීය ප්‍රවේශකයන්ටනොමිලේ පැය 510ක් දක්වා ඉංග්‍රීසි පාඩම් සපයනු ලැබේ.ඔබට ස්ථිර වීසා  හෝ සුදුසු තාවකාලික වීසා  ලැබී ඇත්නම් සහ ඔබට කතා කළ හැක්කේ ඉංග්‍රීසි ස්වල්ප වශයෙන් හෝ ඉංග්‍රීසි කතා කළ නොහැකි නම්, ඔබටAMEP සඳහා සුදුසුකම් ලැබිය හැක. වයස 15 සිට 17 දක්වා වූ සමහරසංක්‍රමණිකයෞවනයින්ටද මීට සුදුසුකම් ලැබිය හැක.

AMEP පංතියකදී ඔබ ඉංග්‍රීසි කුසලතා මෙන්ම ඕස්ට්‍රේලියානු සමාජය පිළිබඳවද තොරතුරු ඉගෙන ගනු ඇත. ඔබට තවත් අළුතින් පැමිණි අය හමු විය හැකි අතර නව මිතුරන් හඳුනා ගනු ඇත. මේවායින් ඔබත් ඔබේ පවුලටත් සාර්ථකව ඕස්ට්‍රේලියාවට හුරු වීමට හැකි වනු ඇත. ඔබ ඕස්ට්‍රේලියාවේ රැකියාවක් කිරීමට සිතන්නේ නම් ඉංග්‍රීසි භාෂා හැකියාවන්ද ඉතා වැදගත් වනු ඇත.

AMEPවැඩසටහන සිදු කරනු ලබන්නේ අනුමත සේවා සපයන්නන් විසින් වන අතර  උගන්වනු ලබන්නේ වෙනත් භාෂා කතා කරන අයට ඉංග්‍රීසි කතා ඉගැන්වීමට පුහුණුව ලබා  ඇති ගුරුවරුන් විසිනි.

### මා පාඨමාලාවට සම්බන්ධ වන්නේ කෙසේද?

AMEP මගින් ඉංග්‍රීසි භාෂා පංතිවලට සහභාගී වීමට නම් ඔබ ඕස්ට්‍රේලියාවට පැමිණීමෙන් හෝ ඔබගේ වීසා ආරම්භ වීමෙන් පසුව මාස හයක් ඇතුළත අනුමත AMEP සේවා සපයන්නකු සමග ලියාපදිංචි විය

යුතුය.ඕස්ට්‍රේලියාවට පැමිණ හෝ ඔබගේ වීසා ආරම්භ වීමෙන් පසුව මාස 12ක් තුළ ඔබ ඉංග්‍රීසි පංති ආරම්භ කළ යුතුය.

AMEP වෙතින් ඉංග්‍රීසි ඉගෙන ගැනීමට ඕස්ට්‍රේලියාවට පැමිණි දින සිට හෝ වීසා ආරම්භ වූ දින සිට වර්ෂ පහක් ඇත. ඔබේ අවශ්‍යතා අනුව ඔබට අමතර පාඩම්වලට සුදුසුකම් ලැබිය හැක.

ඔබේ සේවා සපයන්නා ඔබට හොඳම ප්‍රතිඵලය ලබා ගත හැකි වන පරිදි ඔබේ අවශ්‍යතාවන්ට හොඳින්ම ගැලපෙන පංතියක් තෝරා ගැනීමට ඔබට උපකාරී වනු ඇත.ඔබට ගැලපෙන පරිදි, විවිධ ස්ථානවල, විවිධ වේලාවන්වල පූර්ණ කාලීන සහ අර්ධ කාලීන පංති ඇත.

## අමතර පංති විෂය ධාරා

- ඔබේ අවශ්‍යතාවන්ට වඩාත් හොඳින් ගැලපෙන පරිදි AMEP සේවා සපයන්නා ඔබට විෂය ධාරා දෙකකින් එකක් තෝරා ගැනීමට ඔබට උදව් කරනු ඇත: පූර්ව රැකියා ඉංග්‍රීසි විෂය ධාරාව - සේවා ස්ථානවලදී වැඩ කිරීමට හෝ දිගු කාලීන රැකියාවක් ලබා ගැනීමට මූලික ඉංග්‍රීසි දැනුම සැපයීම සඳහා වේ.
- සමාජයීය ඉංග්‍රීසි විෂය ධාරාව - සමාජයේ කටයුතු කිරීමටත් සිය ප්‍රදේශයේ සමාජය තුළ ස්වාධීනව ජීවත් වීමට විශ්වාසය ඇති කර ගැනීමටත් කථන ඉංග්‍රීසි හැකියාව දියුණු කර ගැනීමට අවශ්‍ය සේවාදායකයන්ට.

ඔබට ලබා දී ඇති පැය 510 මේ එක් විෂය ධාරාවකට හෝ දෙකේම සංකලනයක් සඳහා ඔබට භාවිතා කළ හැක.

අන්‍යෝන්‍ය වගකීම් අවශ්‍යතා සමග ආදායම් උපකාරක ගෙවීම් ලබා ගන්නා සේවාදායකයින් සමාජයීය ඉංග්‍රීසි විෂය ධාරාවට සුදුසුකම් ලබන්නේ නැත.

## මට පංතියට යා නොහැකි නම් කළ යුත්තේ කුමක්ද?

ඔබේ පංතියට යාමට නොහැකි නම්, ඔබේ AMEPසේවා සපයන්නා සමග කතා කරන්න.. නිවසට පැමිණෙන පෞද්ගලික ගුරුවරයෙකු මගින් හෝ AMEP ගුරු-සහාය ඇති අන්තර්ජාල දුරස්ථ ඉගෙනීම මගින් ඉංග්‍රීසි ඉගෙන ගැනීමට ඔබට උපකාර කිරීමට සේවා සපයන්නාට හැකි විය හැක.

තවද AMEP ස්වයං පියවර විද්‍යුත් ඉගෙනීමේ මොඩියුල භාවිතයෙන්www.amepdl.net.au වෙබ් අඩවිය මගින් ඔබට සරිලන වේගයෙන් ඉගෙන ගත හැක. මෙම නොමිලේ පාඩම් ඉංග්‍රීසි ඉගෙන ගැනීම සඳහා සෑම අයකුටම ලබා ගත හැක (AMEPසේවාදායකයන්ට පමණක් නොවේ).

# AMEPඋප වැඩසටහන්

ඔබට විශේෂ අවශ්‍යතා තිබේ නම් ඔබට තවත් අමතර පංති සඳහා සුදුසුකම් ලැබිය හැක.

## විශේෂ සූදානම් කිරීමේ වැඩසටහන (Special Preparatory Program)

Special Preparatory Program (SPP)සංක්‍රමණයට පෙර කටුක අත්දැකීම්වලට මුහුණ දුන් සහ පාසැල් අධ්‍යාපනය සීමා වූ සුදුසුකම් ලත් මානුෂීය ප්‍රවේශකයන්ට අමතර පැය ගණන් සහ උපකාර ප්‍රදානය කරයි.

## රැකියාව සහ පුහුණුව ලබා ගැනීමට හුරු කිරීමේ භාෂා මංපෙත් (Settlement Language Pathways to Employment and Training)

Settlement Language Pathways to Employment and Training (SLPET) වැඩසටහන මගින් ඕස්ට්‍රේලියාවේ රැකියා සංස්කෘතිය සහ පරිචයන්ට හුරු වන අතර, වෘත්තීයට අවශ්‍ය වන ඉංග්‍රීසි ඉගෙන ගැනීමට සුදුසුකම් ලත් සිසුන්ට රැකියා ඉලක්කගත පාඨමාලාවක් සපයයි.

SLPET මගින් වෘත්තීයට අවශ්‍ය ඉංග්‍රීසි භාෂාව සඳහා අමතර පැය 200 දක්වා සපයයි. මෙයට විවිධ කර්මාන්ත පරාසයක් තුළ රැකියා පළපුරුද්ද ලබා දීමේ පැය 80ක් දක්වා වූ කාලයක්ද ඇතුළත් වේ.

## AMEP Extend
## AMEP වැඩිදුර පාඨමාලාව (AMEP Extend)

AMEP වැඩිදුර පාඨමාලාව මගින් ඉංග්‍රීසි භාෂා ප්‍රවීනතා ඉලක්ක අත් කර නොගෙන පැය 510 සම්පූර්ණ කරන සුදුසුකම් ලත් සිසුන්ට අමතර වශයෙන් පැය 490ක් දක්වා ප්‍රදානය කරයි.

## AMEP ළමා සුරැකුම (AMEP child care)

AMEPසේවා සපයන්නන්ට ඔබ පංතිවලට සහභාගී වන අතර නොමිලේ ඔබේ දරුවන් බලා ගැනීමට වැඩ පිළිවෙළක් යෙදිය හැක. නොමිලේ බලා ගනු ලබන්නේ පාසැල් යන වයසට වඩා අඩු දරුවන් පමණි.

## AMEP මංපෙත් මාර්ගෝපදේශය (AMEP pathway guidance)

AMEP සේවා සපයන්නෝ ඔබට ඉලක්ක ඇති කර ගැනීමට, තිබෙන විකල්ප අවබෝධ කර ගැනීමට සහඔබේ අමතර ඉගෙනීම්, වැඩිදුර අධ්‍යාපනය සහ රැකියා අවස්ථා පිළිබඳ තීරණ ගැනීම පිළිබඳ ඇති විකල්ප අවබෝධ කර ගැනීමට ඔබට මාර්ගෝපදේශ සපයති.

**වැඩිදුර විස්තර සඳහා**

| AMEP | සබඳතා තොරතුරු |
|---|---|
| දුරකථන | 13 38 73 |
| AMEP වෙබ් අඩවිය | www.education.gov.au/amep |
| ඊමේල් | skilling@education.gov.au |
| ඉංග්‍රීසි හැර වෙනත් භාෂාවලින් තොරතුරු | www.education.gov.au/amep-information-other-languages |
| මට ඉංග්‍රීසි ඉගෙන ගත හැක්කේ කොතැනද? AMEPසේවා සපයන්නන් සහ ඉගෙනුම් මධ්‍යස්ථාන | www.education.gov.au/adult-migrant-english-program-service-providers |
| AMEP online | www.amepdl.net.au |